දුරකථන
தொலைபேசி
Telephone
2698471
2698475
2698490

ෆැක්ස්
பெக்ஸ்
Fax
2693866

විද්‍යුත් තැපෑල
இணையத்தளம்
www.health.gov.lk
E-mail
postmaster@health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය
எனது இல
My No.
DDG(MS)1/59/298

ඔබේ අංකය
உமது இல
Your No. :

දිනය
திகதி
Date
2019/05/25

# සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரப் போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health Nutrition & Indigenous Medicine

පොදු චක්‍රලේඛ අංක: 01 - 32 /2019

**සියලුම ප්‍රධාන ලේකම්වරුන් /පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,**
**පළාත් / ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,**
**ශික්ෂණ රෝහල්, පළාත් මහ රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,**
**මූලික රෝහල් වෛද්‍ය අධිකාරීවරුන් සහ**
**ආයතන ප්‍රධානීන්.**

**ජාතික විෂ නිවාරණ සතිය - 2019 ඔක්තෝම්බර් 14 සිට 20 දක්වා**

1. ජාතික විෂ නිවාරණ සතිය ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව 2007 වර්ෂයේ සිට අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබන ජාතික සෞඛ්‍ය වැඩපිළිවෙලක් වන අතර එමඟින් විවිධ විෂ වීම් වැළැක්වීම හා ප්‍රතිකාරයන් පිළිබඳව මහජනතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම පුද්ගලයින් දැනුවත් කරනු ලබයි.

2. වෛද්‍ය සංඛ්‍යා ලේඛන දත්තවලට අනුව (2000 සිට 2016 දක්වා) පළිබෝධනාශක විෂවීම් නිසා රෝහල් ගත වන රෝගීන්ගේ සංඛ්‍යාවේ අඩුවීමේ ප්‍රවණතාවයක්ද, ඖෂධ විෂවීම් නිසා රෝහල් ගතවන රෝගීන්ගේ සංඛ්‍යාවේ වැඩිවීමේ ප්‍රවණතාවයක්ද ,දක්නට ලැබේ. ඖෂධ විෂවීම් සඳහා බහුලව භාවිතාවන ඖෂධය ලෙස වාර්තා වී ඇත්තේ වේදනානාශක ඖෂධයක් වන පැරසිටමෝල්ය. වෛද්‍ය අරමුණු සඳහා භාවිතා කරන ඖෂධ වර්ග අවභාවිතය හා ඒවාට ඇබ්බැහි වීම ශ්‍රී ලංකාව තුල සැලකිය යුතු ගැටළුවක් බවට පත්වෙමින් තිබේ. මේ සඳහා බහුලව භාවිතා කරන නිද්‍රා උත්තේජක ඖෂධ වනුයේ Diazepam, Tramadol, Amphetamine, Methamphetamine සහ Caffeine ය. ජාතික අන්තරයාකාර ඖෂධ පාලක මධ්‍යස්ථානයේ වාර්තාවලට අනුව 2017 වර්ෂයේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගෙන් 2706 දෙනෙක් ප්‍රතිකාර සේවාවන් ලබා ගෙන ඇත. 2016 වර්ෂය හා සැසඳීමේදී 2017 වර්ෂය තුල ප්‍රතිකාර සඳහා යොමුවූ සංඛ්‍යාව 15% කින් වැඩි වී ඇත.

3. මෙම ඖෂධ භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් වීම කාලීනව වැදගත් වේ. මේ සඳහා නිවැරදි විද්‍යාත්මක දැනුම ප්‍රජාව වෙත සංනිවේදනය කිරීම සඳහා ජාතික විෂ නිවාරණ සතිය මෙම වසරේදී ද පැවැත්වීමටත්, **"ඖෂධ හා අන්තරායකාර ඖෂධ අවභාවිතය වළකමු"** යන්න මෙවර තේමා පාඨය බවට තීරණය කර තිබේ.

4. ජාතික විෂ නිවාරණ සතිය තුල ජනතාව නිසිපරිදි දැනුවත් කිරීම, සෞඛ්‍ය සේවා ආයතන පද්ධතීන් හරහා සිදුකිරීමටත්, එමගින් සමස්ත ලාංකික ප්‍රජාව දැනුවත් කිරීමත්, මෙකී චක්‍රලේඛය නිකුත් කිරීමේ අභිප්‍රාය වෙයි.

| | | |
|---|---|---|
| නියමිත කාල වකවානුව | - | 2019 ඔක්තෝම්බර් 14 සිට 20 දක්වා |
| තේමාව | - | "ඖෂධ හා අන්තරායකාර ඖෂධ අවභාවිතය වළකමු" |
| අරමුණ | - | **"ඖෂධ හා අන්තරායකාර ඖෂධ අවභාවිතය අවම කිරීම සහ වැළැක්වීම"** |

5.**යෝජිත කාර්යයන් -**

1. කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ප්‍රජාව දැනුවත් කිරීමට අධ්‍යාපනික වැඩසටහන් කේන්ද්‍ර කරගත් ක්‍රියාකාරී වැඩපිළිවෙලක් ආයතනය තුල හා ප්‍රජා මට්ටමින් සංවිධානය කිරීම. උදා. අධ්‍යාපනික දේශන හා අධ්‍යාපනික ප්‍රදර්ශන පැවැත්වීම
2. මෙම චක්‍රලේඛය මගින් දැක්වෙන පරිදි දීප ව්‍යාප්ත මට්ටමින් ප්‍රජාව විධිමත්ව දැනුවත් කිරීම පිණිස වැඩ සටහන් සඳහා උපදෙස් සැපයීම සහ එමගින් ජනතාවට සිදුවන හානි අවම කරලීම.
3. "ජාතික විෂ නිවාරණ සතිය" ක්‍රියාත්මක වන සතිය තුළ සුදුසු පරිදි ආයතනය තුළ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම.

- මේ සම්බන්ධයෙන් අවම වශයෙන් සුදුසු පරිදි එක් වැඩ සටහනක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, දිසා වෛද්‍ය නිලධාරී, මහ රෝහල් සහ ශික්ෂණ රෝහල් මට්ටමෙන් ක්‍රියාත්මක කළ යුතුය.
- මෙම ජාතික වැඩ සටහන කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ, ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මගින් සම්බන්ධීකරණය කරන අතර අවශ්‍ය උපදෙස් දුරකථන අංක 011-2686143 / 011-2691111 - දිගු අංක 2430 ඔස්සේ සහ විද්‍යුත් තැපැල් infotoxlanka@gmail.com මගින් ලබා ගත හැක.
- **මෙම තේමාව යටතේ සකසන ලද සිද්ධාන්තමය කරුණු ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ http://www.toxbaselanka.info වෙබ් අඩවිය හරහා ලබාගැනීමේ පහසුකම් ඇත.**
- මෙම චක්‍රලේඛය කාර්ය මණ්ඩලයේ සියළුදෙනා අතර බෙදාහැරීම සහ දැන ගැනීමට සලස්වන ලෙස ඉල්ලා සිටිනු ලබන අතර එහි ඇතුළත් කරුණු ක්‍රියාත්මක කිරීමට ද වගබලා ගන්නා මෙන් ඉල්ලා සිටිමු.

6. ජාතික විෂ නිවාරණ සතිය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳව සවිස්තර වාර්තාවක් සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් විසින් එම කාර්යයන් නිම කිරීමෙන් පසුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ / බෝනොවන රෝග ඒකකය සහ ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය වෙත 2019 නොවැම්බර් මස 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

වසන්තා පෙරේරා
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය